// **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**

**අති විශෙෂ**

**අංක 2195/37 - 2020 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා - 2020.10.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : තිප්‍රාලේ 1/8/3/53 අත්.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2014/UDA/356.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත විස්තර කරනු ලබන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෝතමීපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නාරාහේන්පිට ගමෙහි (කොට්ඨාස අංක 34) පිහිටි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක කො. 9846 හා 2020.02.27 හා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1267 ක් පමණ වන කැබලි අංක 1, 2, 3, 4, 5 හා 6 ලෙස පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හය (6).

**මූලික පිඹුරු අංක මූ.පි.කො. 9846 හි කැබලි අංක 1 සිට 6 දක්වා වූ ඉඩම් කොටස් :**

කැබලි අංක 1

ඉඩමේ නම: වරිපනම් අංක 190, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: එන්. එන්. පී. අල්විස්, අංක 190, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0156.

කැබලි අංක 2

ඉඩමේ නම: වරිපනම් අංක 190A, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: එන්. ආර්. වී. අල්විස්, අංක 190A, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0156.

කැබලි අංක 3

ඉඩමේ නම: වරිපනම් අංක 192, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: අමිතා ප්‍රියංගා, අංක 192, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0175.

**කැබලි අංක 4**

ඉඩමේ නම: වරිපනම් අංක 192, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: ප්‍රසන්න කුමාර, අංක 192, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0184.

**කැබලි අංක 5**

ඉඩමේ නම: වරිපනම් අංක 194, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත; විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: තිලානි රත්නමාලා, අංක 194, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0249.

**කැබලි අංක 6**

ඉඩමේ නම: වරිපනම් අංක 151/3, ශ්‍රී ජයවර්ධනපුර මාවත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0347.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.11.01 වැනි දින පෙ.ව. 9.00 ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020.11.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී මා ඉදිරියේ දී ඉදිරිපත් කළ යුතුය.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 643

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.